ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION
(Ministry of Public Services, Provincial Councils & Local Government)

තැ.පෙ. / த.பெ.இ / P.O. Box 1123
28/10, මලලසේකර මාවත, කොළඹ 07. ශ්‍රී ලංකාව
28/10, மலலசேகர மாவத்தை, கொழும்பு 07. இலங்கை
28/10, Malalasekara Mawatha, Colombo 07. Sri Lanka

Telephone : 94 11 5980200
Fax : 94 11 2584406
E-mail : mail@slida.lk
Web : www.slida.lk

## සියලුම විභාග අපේක්ෂකයන් වෙත කෙරෙන දැනුම් දීමයි.

## සංවර්ධන නිළධාරී සේවයේ I, II, III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2024

සංවර්ධන නිලධාරී සේවයේ I, II, හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාග, 2024 ජුනි මස 30 වන ඉරිදා පැවැත්වීමට නියමිත අතර, ඒ සඳහා අයදුම්කරුවන් 52,756 ක් අයදුම් කර ඇත. දිවයින පුරා මධ්‍යස්ථාන 353කදී විභාගය පැවැත්වෙනු ඇත.

අයදුම්කරුවන් සඳහා වන ප්‍රවේශ පත්‍ර ඊමේල් මාර්ගයෙන් නිකුත් කිරීම මේ වනවිට අවසන් කර ඇත. මෙතෙක් එම ප්‍රවේශ පත්‍ර තම පෞද්ගලික ඊමේල් ලිපිනය වෙත නොලැබුණු අපේක්ෂකයින් සිටී නම්, සිය ජාතික හැඳුනුම්පත් අංකය යොදා ගනිමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වෙබ් අඩවිය www.slida.lk හරහා ප්‍රවේශ පත්‍රය අදාළ බාගත කිරීමට අවශ්‍ය පහසුකම් මේ වනවිට සලසා ඇත.

අයදුම්පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේදී අයදුම්කරු වෙතින් සිදු වී ඇති අත් වැරදීම් හේතුවෙන් තමන් පෙනී සිටීමට අපේක්ෂිත විෂයන් අදාළ විභාග ප්‍රවේශ පත්‍රයට ඇතුළත් වී නොමැති අවස්ථා වාර්තා වෙමින් පවතින අතර, එම විෂයයන් ඇතුළත් කර ගැනීමට අවස්ථාව ලබා දෙන ලෙස අපේක්ෂකයින් පිරිසක් විසින් කර ඇති ඉල්ලීම සලකා බලා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එකඟතාවය මත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය තීරණය කර ඇත.

ඒ අනුව විභාග ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන්ට අමතරව යම් විෂයයක්/ විෂයයන් විභාග ප්‍රවේශ පත්‍රයට ඇතුළත් කර ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් සඳහා එම සංශෝධනය සිදු කර ගත යුතු ආකාරය පිළිබඳව උපදෙස් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වෙබ් අඩවිය සහ නිල ෆේස්බුක් පිටුව හරහා නුදුරේදීම ලබා දෙනු ඇත. එම උපදෙස් සම්බන්ධයෙන් අවධානයෙන් පසුවන ලෙස අදාළ අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

මෙම සංශෝධනය හැර විභාග ප්‍රවේශ පත්‍රය සම්බන්ධව වෙනත් කිසිදු සංශෝධනයක් සිදු කරනු නොලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
2024 ජුනි 14 දින.